# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2046/7 - 2017 නොවැම්බර් මස 20 වැනි සඳුදා - 2017.11.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**07 වැනි වගන්තිය යටතේ දැන්වීම**

*මගේ යොමු අංකයː*-3/6/2016/06.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකයː*-4-3/7/2016/HW/117.

පොදු ජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම්/ පරවශතාවයන් රජයට අත්කර ගෙන ඇත. ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් දන්වා සිටිමි.

*අත්කරගෙන ඇති ඉඩම් විස්තරය* ː

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 957 ගින්නේරිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගින්නේරිය ගමේ පිහිටි සර්වේ ජනරාල් වෙනුවෙන් කුරුණෑගල කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක කු 2382 හා 2017.10.19 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 සිට 06 දක්වා වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4104 ක් වූ පහත දක්වා ඇති ඉඩම් කැබලි හය (06).

**කැබලි අංක 01**

ඉඩමේ නමː- හිග්ගහමුල හේන; ඉඩම් පරිහරණයː- විවෘත මුඩු බිම; හිමිකම් පාන්නාː- රජය; මුල් හිමිකම් පාන්නාː- ගින්නේරිය වදාකඩ පදිංචි බී. එම්. කරුණාවති; ප්‍රමාණයː- හෙක්ටයාර් 0.2184

**කැබලි අංක 02**

ඉඩමේ නමː- නොදනී; ඉඩම් පරිහරණයː- විවෘත මුඩු බිම; හිමිකම් පාන්නාː- රජය; මුල්හිමිකම් පාන්නාː-නොදනී; ගින්නේරිය වදාකඩ පදිංචි බී. එම්. කරුණාවති විසින් අනවසරයෙන් භුක්ති විඳී; ප්‍රමාණයː- හෙක්ටයාර් 0.0109.

**කැබලි අංක 03**

ඉඩමේ නමː- නොදනී; ඉඩම් පරිහරණයː-විවෘත මුඩු බිම; හිමිකම් පාන්නාː- රජය; මුල් හිමිකම් පාන්නාː- නොදනී; ගින්නේරිය වදාකඩ පදිංචි බී. එම්. ජයසේන විසින් අනවසරයෙන් භුක්ති විඳී ; ප්‍රමාණයː- හෙක්ටයාර් 0.0041.

**කැබලි අංක 04**

ඉඩමේ නමː- හිග්ගහමුල හේන; ඉඩම් පරිහරණයː- විවෘත මුඩු බිම; හිමිකම් පාන්නාː- රජය; මුල් හිමිකම් පාන්නාː- ගින්නේරිය වදාකඩ පදිංචි බී. එම්. ජයසේන; ප්‍රමාණයː- හෙක්ටයාර් 0.0309.

**කැබලි අංක 05**

ඉඩමේ නමː- නොදනී; ඉඩම් පරිහරණයː- විවෘත මුඩු බිම; හිමිකම් පාන්නාː- රජය; මුල් හිමිකම් පාන්නාː- ගින්නේරිය වදාකඩ පදිංචි බී. එම්. රංබණ්ඩා විසින් අනවසරයෙන් භුක්ති විඳී; ප්‍රමාණයː- හෙක්ටයාර් 0.0005.

**කැබලි අංක 06**

ඉඩමේ නමː- හිග්ගහමුල හේන; ඉඩම් පරිහරණයː- මිශ්‍ර වගාවක් සහිත ගෙවත්ත; ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් හා වැසිකිලියක්


1A - G 26623 - 37 (2017/11)


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ඇත; හිමිකම් පාන්නාඃ- රජය; මුල් හිමිකම් පාන්නාඃ- ගින්නේරිය වදාකඩ පදිංචි බී. එම්. රංබණ්ඩා; ප්‍රමාණයඃ-හෙක්ටයාර් 0.1456.

මෙම ඉඩම් කැබලි සඳහා අයිතිවාසිකම්/ පරවශතාවන් කියන සියලු දෙනාම තමන්ගේ නම් *ගැසට් පත්‍රයේ* පළවී ඇතත්, නැතත් එම ඉඩම් සම්බන්ධයෙන් තමන්ට ඇති අයිතිවාසිකම්, එක් එක් බිම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම; පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් එම ඉඩම්වලට ඇති ස්වකීය අයිතියේ ස්වභාවය, එම ඉඩම් කැබලිවල අයිතිය වෙනුවෙන් තමන්ට ඉදිරිපත් කළ හැකි කරුණු හා ඉල්ලනු ලබන වන්දි ප්‍රමාණය හා එය ගණන් බැලූ ආකාරය පිළිබඳ විස්තරයක් 2017. 12. 01. දින මගේ කාර්යාලයේදී මා හමුවී ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව 2017. 12. 15. දින සිට මා විසින් දැනුම් දෙනු ලබන දිනයකදී තමන් විසින්ම නැතහොත් ලිඛිතව බලය පවරනු ලැබූ නියෝජිතයෙකු මගින් නියමිත දින නියමිත වේලාවට, අදාළ ඔප්පු හා මා විසින් නියම කරනු ලබන අනෙකුත් ලියවිලි සමග මා විසින් නියමකරනු ලබන ස්ථානයකදී පනතේ 09 වෙනි වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතු යි.

පරීක්ෂණය සඳහා නියෝජිතයෙකු ඉදිරිපත් කරන්නේ නම් ඉඩම් හිමිකම් කියන්නා විසින් බලය පවරන ලද ලිපියක් නොමැතිව ඔහුගේ/ඇයගේ ප්‍රකාශ හෝ සාක්ෂි සටහන් කරගනු නොලබන බව අවධාරණය කරමි.

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2017 නොවැම්බර් මස 15 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී

12-52

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**07 වැනි වගන්තිය යටතේ සංශෝධිත දැන්වීම**

*මගේ යොමු අංකය* ඃ-කු/DIVE/LAND/ACQUI/15/10.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* ඃ-4-3/7/2016/HW/140.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2014/4 හා 2017 මැයි මස 29 වැනි දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි මා විසින් පළ කර ඇති 07 වැනි වගන්තිය යටතේ සිංහල භාෂාවෙන් පළ කරන ලද දැන්වීමෙහි අත්කර ගැනීමට බලාපොරොත්තු වන ඉඩම් විස්තරය යටතේ පිඹුරු අංකය මූලික පිඹුරු අංක කු 1498 වශයෙන් සඳහන් වී ඇතත්, අවසාන ගම් පිඹුරු අංක 1498 අතිරේක අංක 02, පත්‍ර අංක 02 වශයෙන් සංශෝධනය කරනු ලබන බවද, දෙමළ හා ඉංග්‍රීසි භාෂා දැන්වීම් සංශෝධනය කරනු නොලබන බව ද මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඊ. එම්. එස්. පී. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2017 ඔක්තෝබර් මස 30 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
වීරඹුගෙදර,

12-53

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**
**07 වැනි වගන්තිය යටතේ සංශෝධිත දැන්වීම**

*මගේ යොමු අංකය* ඃ- කු/4/1/32 -E.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* ඃ-4-3/7/2016/HW/69.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2021/5 හා 2017 මැයි මස 29 වැනි දිනැති සඳුදා පළ කරන 07 වැනි වගන්තිය යටතේ මා විසින් පළ කර ඇති සිංහල භාෂාවෙන් පළ කරන ලද දැන්වීමෙහි අනු අංක 19 යටතේ සඳහන් වී ඇති කැබලි අංක 17 යන්න, කැබලි අංක 19 වශයෙන් සංශෝධනය කරනු ලබන බව ද, දෙමළ හා ඉංග්‍රීසි භාෂා දැන්වීම් සංශෝධනය කරනු නොලබන බව ද, මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඊ. එම්. එස්. ප. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2017 ඔක්තෝබර් මස 31 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කුරුණෑගල,

12-55

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.